00375

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - VI වන මට්ටම

පළමු වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023/2024

වාණිජ නීතිය – LLU6716

කාලය : පැය එකයි (01) යි

දිනය: 2024.11.06 වේලාව : ප.ව.01.30 - ප.ව.02.30

මුළු ප්‍රශ්න ගණන - දෙකයි 02

ප්‍රශ්න එකකට (01) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 'භාණ්ඩ විකිණීමේ ගිවිසුම' යන පදය සඳහා සපයා ඇති නිර්වචනය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් හා සමානව දැක්විය හැකි වෙනත් එකඟතාවන් අතර පැහැදිලි සීමාවක් සලකුණු කරයි.

අදාළ නඩු තීන්දු අදාළ කර ගනිමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

2. 'ජූසි ඩිලයිට්ස්' (Juicy Delights) යනු කොළඹ පිහිටි පලතුරු යුෂ බෙදා හැරීමේ අලෙවිසැලකි. මෙම අලෙවිසැල ඉදිරිපිට 'නැවුම් කාබනික පලතුරු යුෂ විකිණීමට ඇත' යනුවෙන් සඳහන් හොඳින් පෙනෙන දැන්වීම් පුවරුවක් ඇත. සිල්වා, ජූසි ඩිලයිට්ස් වෙත ගොස් පලතුරු යුෂ ලීටර් දෙකක් ඉල්ලා සිටියේ එය මිලදී ගනු ලබන්නේ දුර්වල ආහාර රුචියක් ඇති නමුත් පලතුරු යුෂ වලට කැමැත්තක් දක්වන ඔහුගේ පස් හැවිරිදි පුත්‍රයාට බව එහි කාර්ය මණ්ඩලයට පැහැදිලි කරමිනි. එම පලතුරු යුෂ පානය කිරීමෙන් අනතුරුව සිල්වාගේ පුත්‍රයා දැඩි ලෙස රෝගාතුර වූයේ ය. සිල්වා විසින් පසුව ගන්නා ලද තාක්ෂණික වාර්තාවකින් අනාවරණය වූයේ එම පලතුරු යුෂවල හානිකර නොවන කල් තබා ගැනීමේ ද්‍රව්‍ය මෙන්ම හානිකර ආකලන(additives) ද අඩංගු බවත් එහි පලතුරු ප්‍රමාණය 35% ක් පමණක් බවත් ය.

සිල්වා ජූසි ඩිලයිට්ස් සමාගමට එරෙහිව නීතිමය පියවරක් ගැනීමට අදහස් කරයි.

i. භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ සපයා ඇති කොන්දේසි සහ ප්‍රතිඥාහාර ඇසුරෙන් සිල්වාට උපදෙස් දෙන්න. ඔබගේ පිළිතුර අදාල නඩු තීන්දු නීතිය ඇසුරෙන් සනාථ කරන්න.

(ලකුණු 15)

ii Juicy Delights ඔවුන්ගේ නිෂ්පාදන සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර නොගන්නා බවට වෙළඳසැලේ දැන්වීමක් තිබුණේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද? (ලකුණු 5)

(15+5=ලකුණු 20)

***සියළුම හිමිකම ඇවිරිණි***